**<u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2021.03.05</u>**
**<u>පළාත් ඉංජිනේරු කාර්යාංශය</u>**

2021 වර්ෂයේ I කාර්තුවට අදාලව 2021.03.05 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ දී පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ වාර්තාව පහත ඉදිරිපත් කරමි.

2021.03.05 වන දින .ප.ව.2.00 ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ඒ.ඒ.පි.එස්.කේ.කරුණාරත්න මයාගේ ප්‍රධානත්වයෙන් සහ එතුමා විසින් පැමිණ සිටි සියළු නිලධාරීන් පිළිගැනීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කෙරුණි.

<u>සහභාගී වූ නිලධාරීන්</u>

01. ඒ.ඒ.පි.එස්.කේ.කරුණාරත්න මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) - පළාත් ඉංජිනේරු කාර්යාංශය
02. ජී.ඩබ්.පී.පෙරේරා මිය - අධ්‍යක්ෂ (ඉංජිනේරු) - පළාත් ඉංජිනේරු කාර්යාංශය
03. ආර්.පී.ගුණවර්ධන මිය - අධ්‍යක්ෂ (ගොඩනැගිලි) - පළාත් ඉංජිනේරු කාර්යාංශය
04. යි.එස්.ලොකුගේ මිය - විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය
05. පී.ආරියසේන මයා - ප්‍රධාන ගණකාධිකාරී - පළාත් ඉංජිනේරු කර්යාලය
06. ඩී.ඩී.චන්ද්‍රානි සේනවිරත්න මිය - අභ්‍යන්තර විගණක - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව (බ.ප.)
07. ඒ.තලංගම මයා - මූලස්ථාන ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය
08. එල්.එම්.ඩී.ආර්.ද මෙල් මිය - ගණකාධිකාරී -පළාත් ඉංජිනේරු කාර්යාංශය
09. බී.ඩී.සී.එස්.බඹරගම මිය - පරිපාලන නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය
10. ඩබ්.අයි.නිලාන්ති මෙය - මුදල් සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය
11. ආර්.ඒ.එන්.එස්.භාග්‍යා මිය - කළමනාකරණ සේවා නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය
12. එල්.එස්.පී.පෙරේරා මිය - කළමනාකරණ සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය
13. එච්.කේ.අළුත්ගේ මිය - සංවර්ධන නිලධාරී - පළාත් ඉංජිනේරු කාර්යාංශය

ප්‍රාදේශීය ඉංජිනේරුවරු මෙම රැස්වීම සඳහා Zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වන ලදි.

1. ඒ.කේ.රුවන් අලවත්ත මයා - ප්‍රාදේශීය ඉංජිනේරු මීගමුව.
2. එච්.ඒ.කේ.පාර්.පෙරේරා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු හොරණ.
3. එග්.බී.සම්පත් මයා - ප්‍රාදේශීය ඉංජිනේරු පානදුර
4. එල්.ඩී.ගලබඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු මිනුවන්ගොඩ
5. පී.එල්.ඩී.ඒ.එස්.පනාගොඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු බියගම
6. එස්.ඩී.සේනාරත්න මිය- ප්‍රාදේශීය ඉංජිනේරු රත්මලාන
7. ආර්.එම්.ඒ.එස්.සකුන්තලා මිය - ප්‍රාදේශීය ඉංජිනේරු ගම්පහ
8. ආර්.එල්.එන්.රාජපක්ෂ මයා - ප්‍රාදේශීය ඉංජිනේරු හෝමාගම
9. ඩබ්.ජී.පාර්.වෙලාතන්ත්‍රි මයා - ප්‍රාදේශීය ඉංජිනේරු මතුගම
10. පී.ආර්.මධුරංග මයා - ප්‍රාදේශීය ඉංජිනේරු වත්තල
11. පී.ඩී.ආර්.නදිරා මිය - ප්‍රාදේශීය ඉංජිනේරු කොළඹ - ප්‍රාදේශීය ඉංජිනේරු බත්තරමුල්ල (වැ.බ.)
12. එම්.ජේ.එම්.ඩී.එස්.එස්.ජයවර්ධන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු කළුතර

01. පසුගිය විගණන කමිටු වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීම

| | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය/වගකීම |
|---|---|---|---|
| 1.1 ඡේදය | (I) පළාත් සහා නව ගොඩනැගිල්ලට ඔරලෝසු මිලදී ගැනීම WNP/CB/R/CS/2020/AQ/10 හා 2020.02.28 | අදාල විගණන ඡේද සඳහා ලබාදී ඇති පැහැදිලි කිරීම සම්බන්ධව සෑහීමකට පත්විය නොහැකි බවත්, වර්තමානයේ සිටින නිලධාරීන් මේ සම්බන්ධව අදාල නොවන බවත්, ඔවුන්ට කළ හැක්කේ මින් ඉදිරියට මෙවැනි සිදු වීම් ඇති නොවීමට වගබලා ගැනීම බවත්, එහෙත් විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු දැනටත් නිවැරදිව සිදුවන බවට සෑහීමකට පත්විය නොහැකි බව විගණන අධිකාරී ප්‍රකාශ කරන ලදි.<br><br>මෙම විගණන විමසුම සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් ලබා දෙන ලෙස මාර්ග සංවර්ධන අධිකාරියෙන් කැඳවා ඇති බවත්, එම පිළිතුරු සැපයීම සම්බන්ධයෙන් තමන්ටද සෑහීමකට පත්විය නොහැකි බවත්, ලේකම්වරුන්ගේ රැස්වීමේ දී මේ පිළිබඳව සාකච්ඡා කරන බවත් නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) පවසන ලදි. | විගණන විමසුමෙන් දන්වා ඇති කරුණුවලින් ලැබීම් ඉන්වෙන්ට්‍රි ගත කිරීම හා නිකුත් කිරීමට අදාල පැහැදිලි කිරීම් හැර අනිකුත් කරුණු පිළිබඳව තවදුරටත් විගණන අධිකාරී එකඟ නොවන බව ප්‍රකාශ කරන ලදි |
| | (11) හෝමාගම ඉංජිනේරු කාර්යාලයේ ප්‍රසම්පාදන ක්‍රමවේදයට අදාල විගණන විමසුම | මේ වන විට ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල සඳහා අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කිරීම කර ඇති බවත්, චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන්නේ ද යන්න සම්බන්ධයෙන් පසු විපරම් කිරීමට අභ්‍යන්තර ක්‍රමවේදයක් සකස් කර ඇති බවත් මේ වන විට කාර්යාල කිපයකම පසුවිපරම් කටයුතු සිදු කර ඇති බවත් නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) දන්වන ලදි.<br>ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල විශාල වශයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලින් සිදුවන බැවින් නියැදි පරීක්ෂණයක් මඟින් චක්‍රලේඛනයන්ට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරේද යන්න පසුවිපරම් කටයුතු සිදු කිරීම සුදුසු බව විගණන අධිකාරී පෙන්වා දෙන ලදි. | මෙම වසරේ සැලැස්මට ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල පරීක්ෂාව සැලසුම් කර ඇති බවත්, මේ වන විට කාර්යාල 04 ක් පරීක්ෂාකර ඇති බවත් අභ්‍යන්තර විගණක විසින් ප්‍රකාශ කරන ලදි. |

| | | | |
|---|---|---|---|
| 1.2 | (11) නව පළාත් සහා ගොඩනැගිල්ලේ ඉදිකිරීම කටයුතු සඳහා පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට මුදල් ගෙවීම පිළිබඳව | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය රාජ්‍ය ආයතනයක් බැවින් පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට අත්තිකාරම් මුදලක් ගෙවීමේදී කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගැනීම අවශ්‍ය නොවන බව ප්‍රධාන ගණකාධිකාරි විසින් පවසන ලදි.<br><br>පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට එක වරක් පමණක් අත්තිකාරම් ගෙවා ඇති අතර අනෙකුත් සියළු ගෙවීම් සිදුකර ඇත්තේ කළවැඩ වටිනාකම අනුව බවත්, අමාත්‍ය මණ්ඩල තිරණ අනුව සියලු ඉදිකිරීම් කටයුතු PRD ආයතනයට පවරා තිබීමත්, එම ව්‍යාපෘතියේ ව්‍යාපෘති ඉංජිනේරු ලෙස PRD ආයතනය කටයුතු කර ඇති බවත් නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) පැහැදිලි කරන ලදි.<br><br>ඉංජිනේරු කාර්යාංශ වැය ශීර්ෂයය යටතේ සියලු ගෙවීම් සිදුව ඇති බැවින් නව ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධ වගකීම පළාත් ඉංජිනේරු කාර්යාංශයට පැවරෙන බැවින් විගණන විමසුම් පළාත් ඉංජිනේරු කාර්යාංශයට යොමු කිරීමට සිදුවන බව විගණන අධිකාරි පෙන්වා දෙන ලදි. | නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) /ප්‍රධාන ගණකාධිකාරි |
| 1.3 | ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කිරීමේදි ව්‍යාපෘති වාර්තාවක් ලබා ගැනීමේ වැදගත්කම අභ්‍යන්තර විගණන අංශයෙන් දක්වා තිබුණි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) ක්‍රමවේදයක් සකස්කර ඇති බවත් ඒ අනුව කටයුතු කරන බවත් , ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල ව්‍යාපෘති සම්බන්ධයෙන් පරීක්ෂාකර ලද තොරතුරු පදනම් කරගෙන අදියර දෙකක් යටතේ ව්‍යාපෘති කටයුතු සිදු කරන බවත්, මෙම වසරේදී අඩක් නිම කරන ලද ගොඩනැගිලි ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන බවත්, මිල ගණන් කැඳවීමේදි සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහාම මිළ ගණන් කැඳවීමට කටයුතු සිදු කර ඇති බවත්, නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) පෙන්වා දෙන ලදි. | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු/ ගොඩනැගිලි අධ්‍යක්ෂ |
| 2.1 | "Complain Management" විගණන විමසුම<br>අංක:<br>WNP/CB/R/EB/2020/AQ/5 හා 2020.02.10 | මෙම පරිගණක මෘදුකාංගය මෙවන විට භාවිතයට ගැනීම සිදු වන බවත් දිනපතා ලැබෙන ඉල්ලීම් පරීක්ෂාකර ඊට අදාල ඉදිරි කටයුතු සිදු කරන බවත්, මෙම මෘදුකාංගය යාවත් කාලීනව කරගෙන යාම සඳහා වෙනම ඉංජිනේරුවරයෙකු පත් කර ඇති බවත්, ලැබී ඇති සියලු පැමිණිලි ඒ අවස්ථාවේම නඩත්තු කටයුතු පවරා ඇති කාර්ය මණ්ඩලය වෙත යොමු කරන බවත්, කාර්යාල විසින් දුරකථන මාර්ගයෙන් තවමත් පැමිණිලි ඉදිරිපත් කරන බවත් ඒ සඳහාද ඉදිරි කටයුතු සිදු කරන බවත් මූලස්ථාන ඉංජිනේරු පවසන ලදි.<br>මෙම මෘදුකාංගය සම්බන්ධයෙන් මෘදුකාංගය ක්‍රියාත්මක කිරීමට පත්කර ඇති නව ඉංජිනේරුගේ නම ද සඳහන් කර මෙම ගොඩනැගිල්ලේ ඇති සියලු ආයතන වෙත දන්වා යැවීමට ලිපියක් සැකසීම තිරණය විය. | මූලස්ථාන ඉංජිනේරු |

| | | | |
|---|---|---|---|
| 2.2 | හය මාසය ඉක්මවා නිරවුල් නොවූ චෙක්පත් | නිරවුල් නොවූ චෙක්පත් අග්‍රහාර චෙක්පත් බවත්, දැනට එම චෙක්පත් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව ගණකාධිකාරි පැහැදිලි කරන ලදී. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි සියළු ප්‍රාදේශීය ඉංජිනේරුවරු |
| 2.3 | හානි පාඩු සම්බන්ධව | අනතුරු 20 කින් 7 ක වාර්තා පවසන් බවත්, පොලිස් වාර්තා ගැනීමේදී ඇතිවූ අපහසුතාවය මත තවදුරටත් අනතුරු 13 ක කටයුතු අවසන් කිරීමට නොහැකිව් ඇති බවත්, මෙම 13 න් 6 ක කටයුතු අවසන් කිරීමට හැකියාවක් ඇති බවත්, 2020 වර්ෂයට අදාලව නිම කිරීමට අනතුරු නොමැති බවත් පරිපාලන නිලධාරි විසින් පහැදිලි කරන ලදී. මෙම අනතුරු සම්බන්ධයෙන්ද හැකි ඉක්මනින් අවසන් කිරීමට කටයුතු කරන ලෙස විගණන අධිකාරි උපදෙස් දෙන ලදි. ඒසේම මැතකදි ලැබෙන අනතුරු සම්බන්ධව කටයුතු පළමුව නිම කරන බවත්, පසුගිය අනතුරු සම්බන්ධ කටයුතු ඒ අතරම සිදුකරන බවත් දන්වන ලදි. | පරිපාලන නිලධාරි |
| 2.4 | අත්තිකාරම් බී ගිණුමට අදාලව ණය අය නොවීම. | මේ වන විට ස්ථාන මාරුවී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් දැනට මාසිකව අයවන බවත්, 2020 සැප්තැම්බර් මස සිට විදේශ දූත සේවයට ගිය නිලධාරිනියකගෙන් අයවීමට ඇති ණය ශේෂය ගෙන්වා ගැනීමට මේ වන විට විදේශ කටයුතු අමාත්‍යාංශය දැනුවත් කර ඇති බවත්, ප්‍රවර්තන වර්ෂයේදී ස්ථානමාරු වී ගිය ස්ථාන මාරු වී පැමිණි හා විශ්‍රාම ගිය ණය ශේෂ පිළිබඳව කටයුතු යාවත්කාලීන සිදු කරන බවත් ගණකාධිකාරි පැහැදිලි කරන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි |
| 2.5 | කල් ඉකුත්වූ තැන්පතු | රැඳවුම් මුදල් ආපසු ගෙවීම සඳහා පෙබරවාරි වන විට රු.මි.51 පවතින බවත් මෙයින් වැඩි මුදලක් ළඟම පාසැල හොඳම පාසැල ව්‍යාපෘතියට අදාලවන බවත්, අදාළ ව්‍යාපෘති නිමවූ විගස එම මුදල් නිදහස් කිරීමට කටයුතු කරන බවත් ගණකාධිකාරි පැහැදිලි කරන ලදී. | ප්‍රධාන ගණකාධිකාරි / ගණකාධිකාරි / සියලුම ප්‍රාදේශීය ඉංජිනේරු |
| 2.6 | පොදු ආකෘති පත්‍ර කම්ටු වාර්තාව | සතියකින් පමණ අදාල කටයුතු නිමකර දිය හැකි බවත්, එම ආකෘති පත්‍ර ISO ආකෘති පත්‍ර බවත් ගොඩනැගිලි අධ්‍යක්ෂ පවසන ලදි. කටයුතු නිම කිරීමෙන් පසු එම ආකෘති පත්‍ර කට්ටල ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල වෙත යොමු කිරීමටත් එම කට්ටල 2 ක් විගණන අධිකාරි හා අභ්‍යන්තර විගණන අංශයට යැවීමටත් තීරණය විය. | ගොඩනැගිලි අධ්‍යක්ෂ/ පරිපාලන නිලධාරි |

| | | | |
|---|---|---|---|
| 2.7 | වාහන අනතුරු සඳහා රක්ෂණාවරණය ලබා ගැනීම | PF-3043 වාහනය සම්බන්ධ කටයුතු අවසන් බවත්, PF-2886 වාහනයට අදාල කටයුතු තව සති දෙකකින් පමණ අවසන් කිරීමටත් හැකි බව ප්‍රකාශ කරන ලදි.<br><br>මේ වන විට කාර්යාලයේ සියළු වාහන සඳහා තුන්වන පාර්ශව රක්ෂණාවරණ ලබාගෙන ඇති බවත් නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) දන්වන ලදි. | පරිපාලන නිලධාරි |
| 2.8 | මීගමුව ධීවර සමිතිය<br><br>අවිස්සාවේල්ල ඉඩම | දැනට මෙම ධීවර සමිතිය එම ගොඩනැගිල්ලෙන් ඉවත්ව ගොස් ඇති බැවින් එම ඉඩම ප්‍රධාන ලේකම් වෙත පවරා ගැනීමට හැකි බවත්, මෙම ඉඩම සම්බන්ධයෙන් දින රහිත ගිවිසුමක් ඇති බවත් එබැවින් මෙම ඉඩම නැවත ලබා ගැනීමට ක්‍රියාකාරි වන ලෙස විගණන අධිකාරි පැහැදිලි කිරීමක් කරන ලදි.<br><br>මෙම ඉඩමේ අයිතිය පිළිබඳව මේ දක්වා එකඟතාවයක් නොමැති හෙයින් රජය සතු වත්කම් බාහිර පාර්ශවයක් භුක්ති විඳිමට ඉඩනොදී ප්‍රධාන ලේකම්ගේ මැදිහත්වීමෙන් නීති නිලධාරි වෙත යොමු කර අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට තීරණ විය.<br><br>මෙම ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් ලේකම්වරුන්ගේ රැස්වීමේදී සාකච්ඡා කරන බව නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) පවසන ලදි.<br><br>ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ අවිස්සාවේල්ල කාර්යාලය විසින් සෘජුවම බැංකුවට තැන්පත් කරනු ලබන රු.20,000/- ක කුළී ගෙවීම අත්හිටුවා ඇති බව ප්‍රකාශ කරන ලදි.. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) /<br><br>ගොඩනැගිලි අධ්‍යක්ෂ/ පරිපාලන නිලධාරි |
| 2.9 | බියගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය | මේ වන විට සැලැස්මක් යකස් කර අවසන් බවත් තව දුරටත් සංශෝධන කිහිපයක් කිරීමට ඇති බවත්, ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය හා පරිවාස කාර්යාලය වෙන්කිරීමට තාප්පයක් ඉදිකිරීමට සැලසුම්කර ඇති බවත් බියගම ප්‍රාදේශීය ඉංජිනේරු සඳහන් කරන ලද අතර නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම කඩිනමින් සිදු කිරීමට තීරණ විය. | ගොඩනැගිලි අධ්‍යක්ෂ / බියගම ප්‍රාදේශීය ඉංජිනේරු |
| 2.10 | පුහුණු කටයුතු | දැනට පුහුණු කටයුතු නවතා ඇති අතර ඉදිරියේදී ප්‍රසම්පාදන ක්‍රමවේදයේ නව සංශෝධන පිළිබඳ පුහුණුවීම් සිදු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / ගොඩනැගිලි අධ්‍යක්ෂ |
| 2.11 | 2019 වාර්ෂික ගිණුමේ ඇතුලත් අඩුපාඩු<br><br>අක්මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කර නොතිබීම<br><br>ස්ථාවරවත්කම් ලේඛණය පිළියෙල කර නොතිබීම | 2020 අවසන් ගිණුම් සමග අක්මුදල් ගැලපුම් ගිණුම පිළියෙල කර ඇති බවත්,න ලදි.<br><br>2020 ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර ඇති බවත් ගණකාධිකාරී විසින් දන්වන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි/ ගණකාධිකාරි |

| | | | |
|---|---|---|---|
| 3.1 | i. ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) | මෙම මෘදුකාංග පද්ධතිය සඳහා ගෙවීම් සිදු කරන්නේ 90% පමණක් බවත්, ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සොයාබැලීමට කමිටුවක් පත්කිරීමට හැකි බව අධ්‍යක්ෂ ඉංජිනේරු / නි.ප්‍ර.ලේ .(ඉංජිනේරු) ප්‍රකාශ කරන ලදි | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු/ අධ්‍යක්ෂ ඉංජිනේරු / ගොඩනැගිලි අධ්‍යක්ෂ/ ඉංජිනේරු නිර්මිත ආර්.ඒ.විජයප්‍රිය මයා |
| | ii. දෙපාර්තමේන්තු ප්‍රමාණ බිල්පත්‍ර රේට් ගණන් හා කොන්ත්‍රාත්කරුවන්ගේ මිල ගණන් අතර අසාමාන්‍ය වෙනසක් පවතින බව. | කොන්ත්‍රාත්තරුවන් විසින් ටෙන්ඩරය ලබා ගැනීම සඳහා ඇතැම් අයිතම සඳහා අඩු මිල ගනන් හා ඇතැම් අයිතම සඳහා වැඩි මිල ගණන් ඉදිරිපත් කර ඇත. එම මිල ගණන් දෙපාර්තමේන්තු මිල ගණන් සමඟ සසඳා කොන්ත්‍රාත්කරුගෙන් මිල ගණන් විශ්ලේෂණයක් ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට ප්‍රසම්පාදන කමිටුවට නිර්දේශ ලබා දීම හා ප්‍රසම්පාදන කමිටුව විසින් මිල ගණන් වෙනස් වීමට හේතු කොන්ත්‍රාත්කරුගෙන් විමසා අවසාන තීරණයක් ගැනීම සිදු කරන බව ප්‍රකාශ කරන ලදි. | ගොඩනැගිලි අධ්‍යක්ෂ / ප්‍රාදේශීය ඉංජිනේරුවරු |

**2 ) විගණන අධිකාරි විසින් මතු කල දුන් කරුණු**

| | මතුකළ කරුණු | පැහැදිලි කිරීම | තීරණය |
|---|---|---|---|
| 1 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා පරික්ෂාව - 2019 WNP/CB/B/EB/2020/AQ/40 හා 2020.11.30 | විගණන විමසුම් සඳහා පිළිතුරු හා පැහැදිලි කිරීම් ලබාදෙමින් දුන් සහයෝගය අතිවිශිෂ්ට බවත්, පසුගිය වර්ෂය තුළදී ලබාදුන් සහය සම්බන්ධයෙන් හිටපු ප්‍රධාන ගණකාධිකාරි කේ.ඩී.එල්.කඳනආරච්චි මියට ස්තුතිය ප්‍රකාශ කරන ලදි.<br><br>ප්‍රධාන කාර්යාලයේ භාණ්ඩ සඳහා කේත අංක ඇලවීමේදී අඩුපාඩු සිදුවී ඇති බවත්. මූලික ඉන්වෙන්ට්‍රි ලේඛන අනුව භාණ්ඩ අඩුවක් නොමැති බවත්, අංශ අනුව මෘදුකාංගයට ඇතුලත් කිරීමේදී වැරදීම් සිදුවී ඇති බවත්, ඒවා නිවැරදි කිරීමට අවශය කටයුතු සිදු කරන බවත්, ගණකාධිකාරි ප්‍රකාශ කරන ලදි. | ප්‍රධාන ගණකාධිකාරි/ ගණකාධිකාරි |

**(3) අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණන විසින් මතු කල කරුණු**

| | මතුකළ කරුණු | පැහැදිලි කිරීම | වගකීම |
|---|---|---|---|
| i | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල බැංකු සැසඳුම් වාර්තා | පහත සඳහන් ප්‍රාදේශීය කාර්යාල වලින් 2021 ජනවාරි බැංකු සැසඳුම් වාර්තා ඉදිරිපත් කර නොතිබූ බව පවසන ලදි.<br><br>රත්මලාන , බත්තරමුල්ල, ගම්පහ, මීගමුව, බියගම, කොළඹ, වත්තල | ප්‍රාදේශීය ඉංජිනේරු රත්මලාන , බත්තරමුල්ල, ගම්පහ, මීගමුව, බියගම, කොළඹ, වත්තල |
| ii | කොළඹ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ අභ්‍යන්තර විගණන පරීක්ෂණය | අභ්‍යන්තර විගණනය විසින් සිදු කර ඇති විගණනයේදී පහත සඳහන් කරුණු අනාවරණය වූ බව අභ්‍යන්තර විගණක පැහැදිලි කරන ලදි.<br>➢ චෙක්පත් අවලංගුකර ආදායමට ගැනීමේදී කුවිතාන්සියක් නිකුත් කර නොමැතිවීම.<br>➢ චෙක්පත් භාරදීමේ ලේඛනය නිසි ලෙස නඩත්තු කර නොමැති බව.<br>➢ රු.25,000/- වැඩි ගෙවීම් සඳහා මුද්දර ගාස්තු අයකර නොමැති බව.<br>➢ වවුචර්පත් සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබීම.<br>➢ වැටුප් පරීක්ෂා කිරීමකින් තොරව ගෙවා තිබීම.<br>➢ සී සී 10 ණය ලේඛනය තුලනය කර නොතිබීම.<br>➢ නිලනිවාස ලේඛනයක් නඩත්තු කර නොතිබීම | ප්‍රාදේශීය ඉංජිනේරු කොළඹ |

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට පැවැත්වීම ඉතා වැදගත් බවත් විගණනයෙන් ලබාදෙන ලද පැහැදිලි කිරීම් රාජකාරි කටයුතු වලදී යොදා ගැනීම සාර්ථකව රාජකාරි කිරීමට පහසුවක් බවත්, රැස්වීම සඳහා සහභාගී වීම සම්බන්ධයෙන් විගණන අධිකාරී, අභ්‍යන්තර විගණක හා අනෙකුත් සියළු නිලධාරීන්ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ස්තුතිපල කිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු පස්වරු 4.00 ට පමණ අවසන් කරන ලදි.

ජේ.ඒ.පී.එස්.කේ.කරුණාරත්න,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).
පළාත් ඉංජිනේරු කාර්යාංශය